**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.33,000ක් වටිනා ඉඩමක් හා රු.18,172,144 ක් වටිනා වාහන 05ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතුව භෞතිකව නොපැවති රු.225,525 ක් වටිනා වාහන 04ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.1,435,500 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | රු.560,000 ක වටිනාකමින් යුතු රණවිරු ස්මාරකයෙහි වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.110,082 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු. 100,287,747 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාල ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු. 581,944 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ තවදුරටත් ඉදිරියට එමින් පවතින රු.462,504 ක බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 381,343,967 ක් වූ ගිණුම් විෂයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මු.රෙ. 103 හා 104 | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.80,120 ක භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් 2021 ජනවාරි 12 දින පැවති මාසික සභා රැස්වීමේදී කපා හැරීමට තීරණය කර තිබුණි. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,662,212ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.21,406,094 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022<br>ඇස්තමේන්තු ගත ආදායම | <br>බිල්කළ ආදායම | <br>රැස්කළ ආදායම | <br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021<br>ඇස්තමේන්තු ගත ආදායම | <br>බිල්කළ ආදායම | <br>රැස්කළ ආදායම | <br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,243,280 | 7,426,909 | 3,671,984 | 5,514,317 | 3,170,000 | 1,502,521 | 1,223,447 | 1,759,392 |
| කුලී | 8,204,800 | 9,004,009 | 6,767,122 | 6,325,137 | 9,591,800 | 3,398,147 | 714,556 | 4,088,250 |
| බලපත්‍ර ගාස්තු | 1,018,500 | 1,391,990 | 2,229,813 | 38,300 | 1,301,500 | 5,298,693 | 4,674,765 | 876,123 |
| වෙනත් ආදායම් | 1,055,000 | 26,382,554 | 26,906,202 | 185,925 | 16,685,000 | 21,142,690 | 20,433,117 | 709,573 |
| **එකතුව** | 13,521,580 | 44,205,462 | 39,575,121 | 12,063,679 | 30,748,300 | 31,342,051 | 27,045,885 | 7,433,338 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,591,652 ක් වූ අතර, වර්ෂය අවසානයට එම ශේෂය රු.2,044,293 ක් විය. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් දේපළ තක්සේරුකර වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපළ හඳුනා ගනිමින් සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපළ වසර 05 කට වරක් තක්සේරුකර වාර්ෂික වටිනාකම මත බදු අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී 2015 වර්ෂයේ වරිපනම් දේපල තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අය කර තිබුණි. | නව තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | යාවත්කාලීන කරන ලද තක්සේරු වටිනාකම මත බදු අය කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු කඩ කාමර 234 කින් කඩකාමර 95 ක් සඳහා රු.4,991,543 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දින වන විට සභාව සතු ස්ථාන 13 ක කඩ කාමර 68 කට අදාලව කඩ බදු ගිවිසුම් යාවත්කාලින කර නොතිබුණු | තක්සේරු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | නියමිත කාල වකවානු තුල බදු මුදල් තක්සේරු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වෙළෙඳ සංකීර්ණ 13කට අයත් කඩ කාමර 216 කට අදාළව වසර 05 කට වරක් සිදු කළයුතු බදු මුදල් තක්සේරු සංශෝධනයද කර නොතිබුණි. | | |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු1,368,362 ක් හා මුද්දර ගාස්තු රු.46,327,223 ක් විය. | ජ්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(VIII) වගන්තිය ප්‍රකාර නාගරික නොවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ඇතුළත් අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ නාගරික සංවර්ධන බල ප්‍රදේශය ඇතුලත කසළ ටොන් 02 ක් පමණ දෛනිකව එක්රැස් කරන අතර දිරාපත් වන කසළ කඹුරුපිටිය මහජන පොළ අසල ඉඩමකට බැහැර කරන බව නිරීක්ෂණය විය. තවද කසළ බැහැර කරන ස්ථානය කඹුරුපිටිය නගරයට ආසන්න ජනාකීර්ණ ස්ථානයක් වන බැවින් මෙසේ විවෘත භූමියකට කසළ බැහැර කිරීම නිසා අවට ප්‍රදේශය දූර්සන්ධය පැතිර යාමත් වසංගත රෝග පැතිර යාමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | විධිමත් වූ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව. | කසළ කළමනාකරණය විධිමත් කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් කැබලි 31 ක වටිනාකම හා වාහන 02 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PR/01/01 හා 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව විථිපහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් රු.1,714,829 ක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කඩිනමින් හිඟ මුදල් ප්‍රතිපූර්ණය කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ,හෝටල් හා ආපනශාලා 02 කින් ගාස්තු අයකර නොතිබුණි. | අදාළ ගාස්තු අයකරගැනීමට කටයුතු කරනු ලබන බව. | පනත ප්‍රකාරව ආදායම් අය කර ගත යුතු වේ. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.3,442,936 ක් වූ මිලදී ගැනීම් 24 ක් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 207 ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව සිදු කර තිබුණි. | ඉදිරියේදී සියළු මිලදී ගැනීම් අදාළ රීති ප්‍රකාරව සිදු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙලන්ගහවත්ත හා කහන කුට්ටිය මාර්ගය සංවර්ධනය කිරීමේදී නියමිත රේටයන් භාවිතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කාර සමිතියට රු.180,631 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිළ ගණන් භාවිතා කළ අතර, එහි පස් කපන යන්ත්‍රවල පස් කපන ආකාරය පිළිබදව සඳහන් කර නොමැති අතර, ඒ පිළිබඳව තව දුරටත් අදාළ ආයතනයෙන් විමසීමට කටයුතු කරන බව. | HSR රේටයන් අනුගමනය කළයුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවේ සේවය කළ , ස්ථාන මාරු වී ගිය, සේවය හැර ගිය, හා මිය ගිය සේවකයින්18 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.230, 612 ක ණය ශේෂය වසර ගණනනාවක සිට අය නොවී පැවතුණි. | ඉදිරියේදි අයකරගැනීමට කටයුතු කරන බව. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |